# දරුවන් උදෙසා බයිබලයක්



## කඩවසම් වුවත් අනුවණ වූ රජ

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Janie Forest
Alastair Paterson

සකස්කරන්නා: Lyn Doerksen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

ඊශ්‍රායලයේ විනිශ්චයකරු සහ නායකයා වූ සාමුවෙල්
වයස්ගත වූයේය. ඔහු තම පුත්‍රයන්ව ඊශ්‍රායෙල්හි
විනිශ්චයකරුවන් ලෙස පත් කළේ දෙවියන් වහන්සේගේ
සේවයේ සිටි තමාගේ ස්ථානය
ඔවුන්ට ලබා දීමටය. නමුත්
සාමුවෙල්ගේ පුත්‍රයෝ
දුෂ්ඨයෝ වූවෝය. ඔවුහු
මුදලට ආදරය කළ අතර
වංක ලෙස මුදල් ලබා
ගැනීමට තම බලය
භාවිතා කළෝය.



පුත්‍රයන්ගේ දුෂ්ඨකම නිසා ඊශ්‍රායෙල් සෙනඟ දුක් වින්දෝය. අධිකරණය අසාධාරණ ස්ථානයක් විය. සාමුවෙල්ගේ පුතුන්ගේ උපකාර අවශ්‍ය සෑම අවස්ථාවකදීම මිනිසුන්ට මුදල් ගෙවීමට සිදු විය. කුමක් හෝ දෙයක් කළ යුතුව තිබුණි.



“අපව විනිශ්චය කිරීමට අපට රජෙක් දෙන්න”යැයි වැඩිමහල්ලෝ බල කරමින් ඉල්ලා සිටියෝය. සාමුවෙල්ගේ දුෂ්ඨ පුත්‍රයන් තමන්ව විනිශ්චය කරනවාට ඔවුන් කැමති වුයේ නැත. ඔවුන්ට අවශ්‍ය වූයේ ඔවුන් වටා සිටින සියලුම ජාතීන්ට සිටින්නාක් මෙන් රජෙකුය.





සාමුවෙල් කෝපයට පත් වූයේය. ඊශ්‍රායෙලයට
දැනටමත් රජෙක් සිටියි! සදාකාලික හා සර්වබලධාරී
දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් පාලනය කළ සේක.
බොහෝ කලකට පෙර, උන්වහන්සේ ඊජිප්තුවේ
වහල්භාවයෙන් ඔවුන්ව නිදහස් කර,
ඔවුන් ගැලවී යාම සඳහා රතු
මුහුද දෙබෑ කළ සේක.



ඉන්පසු උන්වහන්සේ
ඊශ්‍රායෙල්වරුන්ට
ඔවුන්ගේ මනස්කාන්ත
දේශය දුන්සේක.

සාමුවෙල් යාච්ඤා කළ කල්හි සමිඳාණන් වහන්සේ මෙසේ වදාළ සේක: “ඔවුන් ඔබව ප්‍රතික්ෂේප කළේ නැත, නමුත් ඔවුන් මා ප්‍රතික්ෂේප කළෝය. මා ඔවුන් කෙරෙහි රජකම් නොකරන ලෙස ඔවුන් මා ප්‍රතික්ෂේප කළෝය. ඔව්හු අන් දෙවිවරුන්ට සේවය කළෝය. ඔවුන්ගේ හඬට සවන් දී ඔවුන්ට රජෙක් දෙව”.



දෙවියන් වහන්සේ සාමුවෙල්ට කතා කරමින් මිනිසුන්ට අනතුරු හඟවන ලෙස කීසේක.



භූමික රජවරු බදු ලෙස ඔවුන්ගේ මුදල් ගනු ඇති බවද, ඔවුන්ගේ හොඳම කෙත්වතු සහ මිදිවතු වල සේවයට ඔවුන් යොදවන බවද, ඔවුන්ගේ පුත්‍රයන් ඔහුගේ හමුදාවට බඳවා ගන්නා බවද, දූවරුන්ට ඔහු වෙනුවෙන් වැඩපල කිරීමට අණ කරන බවද ඔවුන්ට අනතුරු හඟවන්න යැයි දෙවියන්

නමුත් මිනිසුන්ට
කෙසේ හෝ
රජෙකු අවශ්‍ය
විය.





දෙවියන් වහන්සේ සාමුවෙල්ව ඉතා කඩවසම්,
ඉතා ලැජ්ජාශීලී සහ ඉතා උස තරුණයෙකු
වෙත ගෙන ගිය සේක. අන් අයට වඩා ඔහු
උසින් වැඩිවිය. ඔහුගේ නම
සාවුල්ය. සාමුවෙල් සාවුල්ව
දුටු විට, සමිඳාණන්
වහන්සේ කතා කොට,
“මොහු මාගේ සෙනඟ
කෙරෙහි රජකම්
කරන්නේයැ” යි
වදාළ සේක.



කීකරු වූ සාමුවෙල් සාවුල්ව ඊශ්‍රායලයේ රජු ලෙස අභිෂේක කළේය. ඔහු සාවුල්ව ඊශ්‍රායෙල් සෙනඟට ඉදිරිපත් කළ විට, ඔවුහු “රජතුමාට දීර්ඝායුෂ ලැබේවා!” යි කෑගැසුවෝය.

වැඩි කල් නොගොස් සාවුල් රජු පරීක්ෂාවට ලක් වූයේය. ඊශ්‍රායෙල්වරුන්ට වෛර කළ අම්මොන්වරු ඊශ්‍රායෙල් නගරයක් වටලා සෑම මිනිසෙකුගේම දකුණු ඇස උදුරා දමන බවට තර්ජනය කළෝය. මොනතරම් කුරිරු සැලැස්මක්ද?

තර්ජනය ගැන ප්‍රවෘත්තිය සාවුල් රජතුමා වෙත ගියේය.



ඔහු තම හමුදාව සූදානම් කළේය.



හමුදාවන් දෙක එකට
හමු වූ විට සාවුල්
අම්මොන්වරුන්
විනාශ කර නගරය
බේරාගත්තේය.
සාවුල් රජ දෙවියන්
වහන්සේට මහිමය
ලබා දෙමින්, “අද
සමිඳාණන් වහන්සේ
ඉශ්රායෙල්හි ගැළවීම
ඉටු කළ සේක!” යි
කීවේය.

දෙවියන් වහන්සේ එදා සාවුල්ට විශිෂ්ට ජයග්‍රහණයක් ලබා දුන්සේක. නමුත් සාවුල් නිතරම දෙවියන් වහන්සේට ගෞරව නොකළේය. දිනක් පිලිස්තිවරුන්ට විරුද්ධව සටන් කරන්නට පෙර සාවුල් දෙවියන් වහන්සේට පූජාවක් ඔප්පු කළ සේක. එය සාමුවෙල්ට අයිති කාර්යයක් බව ඔහු දැන සිටියේය. එය කිරීමට සාමුවෙල් පැමිණෙන තුරු ඔහු සිටීම දෙවියන් වහන්සේගේ කැමැත්ත බව ඔහු දැන සිටියේය. නමුත් සාවුල් දෙවියන් වහන්සේට අකීකරු වූයේය!



සාමුවෙල් පැමිණි විට, ඔහු සාවුල්ට කතා කොට,
“ඔබ ක්‍රියා කර ඇත්තේ අනුවණ ලෙසය, ඔබේ දෙවි
සමිඳාණන් වහන්සේගේ ආඥාව ඔබ නොපිළිපැද්දේය,
දැන් ඔබේ රාජ්‍යය පවතින්නේ නැතැ” යි
කීවේය.



එය කුඩා පාපයක් යැයි සාවුල් සිතන්නට ඇත. නමුත් දෙවියන් වහන්සේට අකීකරු වීම සැමවිටම බරපතළ කාරණාවකි.



තවත් අවස්ථාවක, අමලෙක්වරුන්ගේ දුෂ්ඨ ජනතාව විනාශ කරන ලෙස දෙවියන් වහන්සේ සාවුල්ට අණ කළසේක.



නමුත් සාවුල් සහ සෙනඟ අමලෙක්හි ආගග් රජුට ජීවත් වීමට ඉඩ හැරියේය. ඔවුහු වටිනා භාණ්ඩ, බැටළුවන් සහ ගවයන් ද තබා ගත්හ. සාවුල් පැවසුවේ ඔවුන් මේ දේවල් සමිඳාණන් වහන්සේට පූජා කිරීමට තබාගත් බවය.

සාමුවෙල් සාවුල්ට කතා කොට, “පූජාවට වඩා කීකරු වීම උතුම් ය. ඔබ සමිඳාණන් වහන්සේගේ වචනය ප්‍රතික්ෂේප කළේය, සමිඳාණන් වහන්සේ ඉශ්රායෙල්හි රජ වීමෙන් ඔබ ප්‍රතික්ෂේප කළ සේක” යි කීවේය. සාවුල් තමා කළ පාපය ගැන බොහෝ කණගාටු වූයේය. නමුත් එය ප්‍රමාද වැඩිය. ඔහු සමිඳාණන් වහන්සේට කීකරු නොවූ නිසා ඔහුගේ ජීවිතයේ ඉතිරි කාලය කණගාටුදායක ලෙස ගතවිය.



# කඩවසම් වුවත් අනුවණ වූ රජ

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

1 සාමුවෙල් 8-16

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහෝ සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)